## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- නාට්‍ය හා රංග කලා **අදාළ සතිය** :- නොවැම්බර් 3 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-2.5 නාට්‍ය පෙළක් ලියමු

. **3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

08. නාට්‍ය පෙළක් රචනා කිරීමේ ක්‍රියා පිළිවෙළ සාරාංශ කර දක්වන්න.

09. නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුනක් කෙටියෙන් විස්තර කරන්න.

10. පහත සඳහන් කතා සැකිල්ල උපයෝගී කරගෙන නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න.

කුඩා කල සිට ම මව නොමැතිව තම පුතා හදා වඩා ගත් සියාතු උසස් අධ්‍යාපනයෙන් පසුව එංගලන්තයට ගිය තම පුතු එනතුරු හැම දිනක ම දෑස් දල්වා බලා හිඳීම පුරුද්දක් කරගෙන සිටි. දහවල කෙටි නින්දකට වැටී සිටි ඔහුට තම පුතු විත් දොරට තට්ටු කරන හඬ ඇසී දොර හැර බැලූ විට.....



* සංවාද, රංග විධාන සහිතව පෙළ නිර්මාණය කරන්න.
* චරිත අතර ගැටුමක් ඇති වන ආකාරයෙන් පෙළ නිර්මාණය කරන්න.
* දෙගිඩියාව, උත්ප්‍රාසය හා කුතුහලය සහිතව නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය කරන්න.

**4.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි ඉගෙනුම් ආධාරක**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය රංග කලා අතිරේක කියවීම් පොත
- You tube නාලිකා :-
- https://www.youtube.com/watch?v=mO5R31WuYQc&t=74s

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- නාට්‍යයක් රචනා කිරීමට සුදුසු කතා ප්‍රවෘත්ති තෝරාගනියි.
- නාට්‍යෝචිත ව සිදුවීම් ගළපාගනියි.
- තෝරාගත් කතා පුවතට නව අර්ථකථනයක් ලබා දේ.
- නාට්‍ය පෙළක් රචනා කරයි.
- නාට්‍ය පෙළක තිබිය යුතු මූලිකාංග වටහාගනී.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය